**ශීර්ෂය 190 - නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය හා පොලිස් දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශය හා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 190 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 2015 ජූනි 12 |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | 2015 ජූනි 19 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 53,485.4 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 52,611.2 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් පිළිවෙළින් රු.මිලියන 316.7 ක් හා රු.මිලියන 557.5 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.0 ක් හා සියයට 1.2 ක් වී තිබුණි.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 190 | 6,326.2 | 6,009.5 | 316.7 | 5.01 |
| 225 | 47,159.2 | 46,601.7 | 557.5 | 1.18 |
| **එකතුව** | **53,485.4** | **52,611.2** | **874.2** | **1.63** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 19001 | 217.0 | 115.4 | 83.0 | 109.4 | 475.0 | 172.9 |
| 22501 | 1,400.0 | 1,073.5 | 1,100.0 | 1,116.9 | 4,500.0 | 2,348.4 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 137.1 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 7002/0000/00/0430/0014/000 | 0.5 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0031/0014/000 | 136.6 |
| **එකතුව** | | 137.1 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 264.0 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- | --- |
| | | රු.මිලියන |
| නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0201/000 | 28.8 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0106/000 | 235.2 |
| **එකතුව** | | **264.0** |

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

**3. ශීර්ෂ 190 - නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
| --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයන් 06 ක් සඳහා සළසා තිබුණු රු.5,460,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදනය සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 84 ත් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය විසින් 2015 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුම් එකකට අදාල ශේෂවල එකතුව රු.558,508 ක් වී තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.2,281,224 ක් වූ තැන්පතු 6 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 19001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීමේ හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,303,403 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 03 කට අඩු කාල පරාසයක සිට පැවැත එන නමුත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ආ)** මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,835,182 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාර ක්‍රියාකර නොතිබුණි.

**3.6 වත්කම් කළමණාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.145,986,462 ක් වූ අතර එම බැරකම් වර්ෂ එකකට වඩා අඩු කාලයක සිට පැවත එන ශේෂ විය.

**3.7 පාඩු හා හානි**

සමාලෝචිත වර්ෂයේදී පොලිස් විශේෂ කාර්ය බලකායට අයත් වාහන 15 ක් අනතුරුවලට ලක් වීමෙන් රු.3,908,926 ක අලාභහානි සිදු වී තිබුණි. එම අගාභහානි අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 59 | 39 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 365 | 201 | 164 |
| (iii) | ද්විතියික මට්ටම | 9,835 | 7,947 | 1,888 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 25 | 14 | 11 |
| | එකතුව | **10,284** | **8,201** | **2,083** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට විවිධ ශ්‍රේණිවලට අදාල සමස්ත අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 20 කට සමාන පුරප්පාඩු 2,083 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 225 - පොලිස් දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 4.2 විසර්ජන ගිණුම

#### 4.2.1 අයවැය විචලනය

වැය විෂයන් 7 ක් සඳහා අධි ප්‍රතිපාදනය සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ත් සියයට 97 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 4.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව විසින් 2015 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමෙහි ශේෂය රු.2,959,156 ක් වී තිබුණි.

### 4.4 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.66,624,459 ක් වූ තැන්පතු 218 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් කාර්යන් සඳහා ලබා දී තිබුණු රු.2,836,442 ක් අදාල කාර්යභාරයන් ඉටු නොකර වර්ෂ 2 කට අධික කාලයක සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) බැංකු ප්‍රකාශනවල සඳහන් රු.389,821 ක් වූ හඳුනා නොගත් මුදල් ලැබීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) නිකුත්කල නමුත් අවලංගු කළ කල් ඉකුත් වූ එකතුව රු.3,293,316 ක් වටිනා චෙක්පත් 101 ක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 4.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීමේ හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.133,398,524 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාල පරාසයක සිට පැවැත එන නමුත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) මිය ගිය, විශ්‍රාම ගිය හා වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.41,949,346 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව දෙපාර්තමේන්තු පාලන ගිණුමේ හා කොට්ඨාශ කාර්යාල විසින් පිළියෙළ කරනු ලැබූ කේවල ශේෂ වර්ගීකරණය අතර හඳුනානොගත් රු.3,434,465 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 4.6 වත්කම් කළමනාකරණය

පොලිස් දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම

විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

පොලිස් දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන බැරකම් රු.350,270,405 ක් විය.

## 4.7 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පොලිස් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | නිම කළ දිනය | 2014 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | |
| නුවරඑළිය කණිෂ්ඨ නිලධාරීන්ගේ භෝජනාගාරය ඉදිකිරිම | 36,462,890 | 2013.05.14 | 2014.03.14 | - | 28,633,176 | විදුලිය ලබා දීමේදී ඇති වූ ගැටලු නිසා ඒවා නිරාකරණය කර ගැනීමට කාලය ගත වීම. |
| නුවරඑළිය පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ භෝජනාගාරය ඉදිකිරීම | 59,844,108 | 2013.05.21 | 2014.02.21 | 2015.05.05 | 12,471,651 | ආරක්ෂිත පැති බැම්මක් ඉදිකිරීම. |
| යාපනය පොලිස් සංකීර්ණය ඉදිකිරිම | 252,764,798 | 2011.12.21 | 2013.06.20 | - | 118,927,916 | ප්‍රමාණ බිල්පත්හි අගයන් වෙනස් වීම නිසා 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්තාව ලබා ගැනීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පිරිවැය ඇස්තමේන්තු කමිටුව වෙත ඉදිරිපත් කර තිබීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පේදුරුතුඩුව පොලිස් ස්ථානය ඉදිකිරීම | 101,583,661 | 2011.12.21 | 2014.12.21 | - | 65,213,995 | ප්‍රමාණ බිල්පත්හි අගයන් වෙනස් වීම නිසා 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ය ප්‍රකාරව වාර්තාව ලබා ගැනීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වේ පිරිවැය ඇස්තමේන්තු කමිටුව වෙත ඉදිරිපත් කර තිබීම. |
| පුලස්තිපුර පොලිස් ස්ථානයේ හට නිවාසය ඉදිකිරීම | 32,168,468 | 2014.03.21 | 2014.12.21 | 2015.02.05 | 29,642,597 | ඉහළ මහලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම, විදුලිය කපා හැරීම නිසා දවල් කාලයේ වැඩ කිරීමට නොහැකි වීම, ආරක්ෂක හේතුන්මත රාත්‍රී කාලයේ වැඩ කිරීමට නොහැකි වීම, අහිතකර කාළගුණය හේතුවීම. |
| නෙළුව පොලිස් ස්ථානයේ ඉදිකිරීම් | 46,435,154. | 2014.03.10 | 2014.12.06 | 2015.02.10 | 32,962,672 | අධික වර්ෂාව නිසා වහලයේ තැනීම දක්වා කටයුතු ප්‍රමාද වීම. |
| මරදාන ජල ටැංකි ඉදිකිරීම් | 20,271,308 | 2014.06.18 | 2014.12.18 | - | 5,390,805 | ඉදිකිරීම් කරගෙන යන අවස්ථාවේ අපද්‍රව්‍ය සහිත නල මාර්ගයක් හමුවී ඇති බැවින් නගර සභාව සමඟ ඒ සම්බන්ධයෙන් |

කටයුතු කිරීමට
සිදුවීම.

## 4.8 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ග්‍රහන අපරාධ

ශ්‍රී ලංකාව තුළ 2013 සහ 2014 වර්ෂවලට අදාලව වාර්තා වූ ග්‍රහන අපරාධ (ශාරීරික වැරදි දේපළ වැරදි) පිළිබඳ සමාලෝචනයන් පහත දැක්වේ.

| | ග්‍රහන අපරාධ | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ ගණන | විසඳූ ගණන | විසඳූ ගණනේ ප්‍රතිශතය | වාර්තා වූ ගණන | විසඳූ ගණන | විසඳූ ගණනේ ප්‍රතිශතය |
| | **ශාරීරික වැරදි** | | | | | | |
| 01 | අපහරණය / පැහැරගෙන යාම් | 1019 | 249 | 24.43 | 1075 | 887 | 82.51 |
| 02 | බරපතල තුවාල සිදුකිරීම් | 1402 | 612 | 43.65 | 1414 | 1330 | 94.05 |
| 03 | පිහි ආදියෙන් තුවාල සිදුකිරීම් | 2635 | 1048 | 39.77 | 2683 | 2466 | 91.91 |
| 04 | මනුෂ්‍ය ඝාතනය / සියපණ හානිකර ගැනීමට අනුබල දීම | 548 | 162 | 29.56 | 586 | 522 | 89.07 |
| 05 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම | 187 | 45 | 24.06 | 209 | 191 | 91.38 |
| 06 | ස්ත්‍රී දූෂණය / බාල ගැහැණු ළමුන් සමග කාමුක සංසර්ගය | 2008 | 249 | 12.40 | 2193 | 2051 | 93.52 |
| 07 | අස්වාභාවික වැරදි / පුරුෂයන් අතර තදබල අශෝබන ක්‍රියා | 560 | 54 | 9.64 | 614 | 555 | 90.39 |
| 08 | ළමුන්ට කෲර ලෙස සැලකීම හා ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 376 | 65 | 17.28 | 395 | 370 | 93.67 |
| 09 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රියක / ගැහැණු ළමයකු සැපයීම හා වෙළඳාම | 22 | 9 | 40.90 | 09 | 08 | 88.88 |
| | **එකතුව** | **8757** | **2493** | **28.46** | **9178** | **8380** | **91.30** |
| | **දේපළ වැරදි** | | | | | | |
| 01 | ගිනිතැබීම | 575 | 180 | 31.30 | 444 | 286 | 64.41 |
| 02 | රු.5,000 ට වැඩි අලාභ ඇතිවන පරිදි සිදුකරන අනර්ථ | 1193 | 329 | 27.57 | 1025 | 809 | 78.92 |
| 03 | ගෙවල් බිඳීම හා සොරකම | 15024 | 3244 | 21.59 | 16123 | 6116 | 37.93 |
| 04 | කැරලි කෝලහල | 11 | 3 | 27.27 | 07 | 06 | 85.71 |
| 05 | මංකොල්ලකෑම | 4213 | 1033 | 24.52 | 4748 | 2573 | 54.19 |
| 06 | බලෙන්පැහැර ගැනීම | 134 | 37 | 27.61 | 140 | 111 | 79.28 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 07 | රැවටීම්/වංචා සහගත ලෙස අත්සන් ගැනීම් රු.100,000ට වැඩි වටිනාකම සම්බන්ධයෙන් සාපරාධි විශ්වාසය කඩකිරීම | 8633 | 3332 | 38.59 | 10421 | 6010 | 57.67 |
| 08 | වැව්ලි ද්‍රව්‍ය ඇතුළු රු.5,000 ට වැඩි දේපළ සොරකම හා කුමන වටිනාකමක් හෝ වන පරිදි පා පැදි හා ගව සොරකම | 10914 | 3884 | 35.58 | 11436 | 6748 | 59.00 |
| 09 | ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම | 52 | 2 | 3.84 | 59 | 50 | 84.74 |
| 10 | රාජ්‍ය විරෝධි අන්දමින් සිදුකෙරෙන වැරදි | 0 | 0 | - | 01 | 01 | 100.0 |
| 11 | දරුණු ආයුධ පනත යටතට ගැනෙන වැරදි | 124 | 18 | 14.52 | 125 | 111 | 88.80 |
| 12 | ස්වයංක්‍රීය හෝ රිපීටර් පතරොම් තුවක්කු ලඟතබා ගැනීම | 21 | 4 | 19.04 | 33 | 32 | 96.96 |
| 13 | හෙරොයින්, කොකේන්, මෝෆින් කිසියම්ම ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම, වෙළදාම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 02 ක් හෝ ඊට වැඩි ඔපියම් ග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ගංජා කි.ග්‍රෑම් 05 ක් හෝ ඊට වැඩි හා හෂීස් කි.ග්‍රෑම් 01 ක ප්‍රමාණයක් වු අන්තරාදායක මත්ද්‍රව්‍ය ලගතබාගැනීම. | 1153 | 505 | 43.79 | 1604 | 1594 | 99.37 |
| | **එකතුව** | 42047 | 12571 | 29.89 | 46166 | 24447 | 52.95 |
| | **මුළු එකතුව** | **50804** | **15064** | **29.65** | **55344** | **32827** | **59.31** |

නොවිසඳී ඇති අපරාධ සම්බන්ධව හා අපරාධ විසදීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට පසු විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි.

## (ආ) රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව

ශ්‍රී ලංකාව තුළ 2014 සහ 2013 වර්ෂවලට අදාලව වාර්තා වු මාර්ග අනතුරු පිළිබඳ සමාලෝචනයන් පහත දැක්වේ.

| **අනතුරේ ස්වාභාවය** | **2014** | | | | **2013** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වාර්තා වූ ඇති සංඛ්‍යාව | නඩු පැවරූ ගණන | විභාග අවසන් වූ ගණන | විභාග වෙමින් පවතින ගණන | වාර්තා වූ ඇති සංඛ්‍යාව | නඩු පැවරූ ගණන | විභාග අවසන් වූ ගණන | විභාග වෙමින් පවතින ගණන |
| මාරක අනතුරු | 2261 | 1371 | 413 | 958 | 2190 | 1952 | 863 | 1089 |
| බරපතල තුවාල අනතුරු | 6847 | 5721 | 3582 | 2139 | 6870 | 6051 | 4748 | 1303 |
| සුලු තුවාල අනතුරු සංඛ්‍යාව | 12950 | 8709 | 7033 | 1676 | 13525 | 9689 | 8650 | 1039 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අලාභ අනතුරු සංඛ්‍යාව | 13992 | 9216 | 8559 | 657 | 15292 | 10697 | 10005 | 692 |
| | -------- | --------- | -------- | -------- | ---------- | ---------- | -------- | -------- |
| **මුළු අනතුරු සංඛ්‍යාව** | **36050** | **25017** | **19587** | **5430** | **37877** | **28389** | **24266** | **4123** |
| | ==== | ==== | ==== | ==== | ==== | ==== | ==== | === |

පෙර වර්ෂය හා සැසදීමේදී සමාලෝචිත වර්ෂයේදී මාරක රිය අනතුරු වැඩි වී තිබූ අතර අනතුරු සම්බන්ධ නඩු පැවරීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

## 4.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළ යුතු ශේෂ

පොලිස් දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ 48 කට අදාලව ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | **ගැලපුම් පිළිබඳ විස්තර** | **කාල විශ්ලේෂණය**<br>**මාස 06 ට වැඩි වර්ෂ 01ට අඩු** | <br>**වර්ෂ 01 ට වැඩි 03ට අඩු** | **එකතුව** |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 443,773 | 224,605 | 668,378 |
| (ii) | හඳුනානොගත් හර | 33,162 | 82,061 | 115,223 |
| (iii) | හඳුනානොගත් බැර | 354,254 | 120,106 | 474,360 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 6 ක කාලය ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) හඳුනානොගත් හර කිරීම් සහ බැර කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.10 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේදී සිදු වූ පාඩු හා හානි කිසිවක් විසර්ජන ගිණුමෙහි දක්වා නොතිබුණි. නමුත් පොලිස් දෙපාර්තමේන්තුවට අදාලව 2014 වර්ෂයේදී පාඩු හා හානි සිද්ධීන් 455 ක් දේපල කළමනාකරණ කොට්ඨාශය වෙත වාර්තා වී තිබුණි. ඉන් සිද්ධීන් 346 ක් සඳහා ඇස්තමේන්තුගත අලාභය රු.44,039,326 ක් විය. පාඩු හා හානි සිද්ධීන් 109 ක් සඳහා ඇස්තමේන්තුගත අලාභ දේපල කළමනාකරණ කොට්ඨාශය වෙත වාර්තා කර නොතිබුණි.

## 4.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 702 | 532 | 170 |
| (ii) | තෘතියික මට්ටම | 3,786 | 3,254 | 532 |
| (iii) | ද්විතියික මට්ටම | 85,527 | 72,181 | 13,346 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,691 | 1,164 | 527 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික කොන්ත්‍රාත් පදනම) | - | 420 | - |
| | **එකතුව** | **91,706** | **77,551** | **14,575** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 14,575 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. 2015 අප්‍රේල් 30 දින වන විට සිවිල් නිලධාරී පුරප්පාඩුවලින් 480 ක් පුරවා ඇති අතර ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරමින් පවතින බව පොලිස්පති වරයා විසින් මා වෙත වාර්තා කර තිබුණි.

(ආ) තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ කොන්ත්‍රාත් පදනම මත සිටින තෘතියීය මට්ටමේ එක් නිලධාරියෙක්ද ඇතුළත් වී තිබුණි.